**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් PLC**

**පෞද්ගලික දත්ත රහස්‍යතා ආරක්ෂණ නිවේදනය**

මෙම පෞද්ගලික දත්ත රහස්‍යතා ආරක්ෂණ නිවේදනයේ NDB බැංකුව වන අප විසින් පිරිනමනු ලබන නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධයෙන් ගණුදෙනුකරුවන්ගේ තොරතුරු රැස්කිරීම, භාවිතා කිරීම, සකස්කිරීම සහ රඳවා තබාගැනීම් සඳහා වූ සියලුම තොරතුරු අදාල වේ.

පුද්ගලිකත්වය සහ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම පිළිබඳ පුද්ගල අයිතිවාසිකම් වලට අප ගරු කරන්නෙමු. මෙම රහස්‍යතා නිවේදනයේ පරමාර්ථය වනුයේ අපගේ බැංකු මෙහෙයුම් සඳහා පුද්ගලික තොරතුරු රැස්කිරීම සහ පරිශීලනය කරන ආකාරය විධිමත්ව සන්නිවේදනය කිරීමයි.

ගණුදෙනුකරුවන්ගේ දත්ත සාධාරණ සහ සදාචාරාත්මකව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටියන්ට අනුකූලව භාවිතා කරන බවට අපගේ ගණුදෙනුකරුවන්ට සහතික වීමට කැමැත්තෙමු.

පෞද්ගලික දත්ත යනු, යම් නාමයක්, හඳුනා ගැනීමේ අංකයක්, මූල්‍ය දත්තයක්, ස්ථානීය දත්තයක් හෝ යම් මාර්ගගත හඳුන්වනයක් වැනි යම් හඳුන්වනයක් හෝ එම පුද්ගලයාගේ හෝ තැනැත්තාගේ කායික විද්‍යාත්මක, කායික, ජානමය, මානසික, ආර්ථික, සංස්කෘතික හෝ සාමාජීය අනන්‍යතාවයට විශේෂිත වූ සාධක එකක් හෝ වැඩි ප්‍රමාණයක් ආශ්‍රයෙන්, සෘජුව හෝ අන්‍යාකාරයෙන් යම් දත්ත දායකයකු හඳුනා ගත හැකි යම් තොරතුරක් අදහස් වේ.

## 1. අපි ගැන

නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව පී.එල්.සී (National Development Bank PLC) ( ලියාපදිංචි අංක PQ 27 දරණ) ලියාපදිංචි කාර්යාල ලිපිනය අංක. 40, නවම් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ස්ථානයේ අංක 1979 අංක 2 දරණ NDB බැංකු පනත යටතේ ස්ථාපිත සමාගමක් වන අතර, 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ සමාගමකි. තවද 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ අතර, 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ (කලින් කලට සංශෝධිත) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස ශ්‍රී ලංකා මහා බැංකුවෙන් බලපත්‍ර හිමි කර ගෙන ඇත. අප හා සම්බන්ධ වීමේ තොරතුරු https://www.ndbbank.com/contact යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

## 2. අපි ඔබගේ පුද්ගලික තොරතුරු ලබා ගැනීමේ හේතුව නම්,

ඔබගේ පුද්ගලික තොරතුරු භාවිතය, භාවිතා කරන ආකාරය විධිමත් කිරීම සහ රැස්කිරීම සිදුකරන හේතූන් නම්,

**(a) ඔබට සේවාවන් සැපයීමට සහ අපගේ සේවාවන් අඛණ්ඩව වැඩි දියුණු කිරීමට**

(i) අදාළ නිෂ්පාදන සහ සේවාවන් සඳහා අවශ්‍ය පරිදි අපගේ වගකීම් ඔබ වෙනුවෙන් ඉටු කිරීමට,



Classification:Public

(ii) ඔබේ අනන්‍යතාවය පරීක්ෂා කර අවශ්‍ය වාර්තා ලබා ගැනීමට සහ ඔබගේ ණය වටිනාකම් තක්සේරු කිරීමට,

(iii) ඔබගේ ගිණුම් ස්ථාපිත කිරීමට සහ කළමනාකරණය කිරීමට හෝ පහසුකම් සැලසීමට සහ ඔබ නියැලීමට බලාපොරොත්තු වන ගෙවීම් ඉල්ලීම් ඇතුළු ගණුදෙනු සිදු කිරීමට,

(iv) ඔබට අවශ්‍ය සේවාවන් සැපයීමට සහ අපගේ නිෂ්පාදනයන් සහ සේවාවන් සඳහා ඔබෙන් අපට හිමිවිය යුතු ගෙවීම් අය කරගැනීමට,

(v) අපගේ වාර්තා යාවත්කාලීනව තබා ගැනීමට

(b) **අපගේ නීත්‍යානුකූල බැඳියාව උදෙසා**

(i) අපගේ ව්‍යාපාර මෙහෙයුම් විගණනය සහ යහපාලනය, ගිණුම්කරණය සහ කළමනාකරණය සඳහා,

(ii) ණය විමර්ශන ආයතන වල සිදුකරන පරීක්ෂාකිරීම් සඳහා,

(iii) ඔබගේ ගිණුම් වල තත්වය සහතික කිරීම වෙනුවෙන් ඔබගේ ගිණුම් සම්බන්ධ කර ඇති ඊ-මේල්, ඇමතුම් පටිගත කිරීම සහ වෙනත් සන්නිවේදනයන් සහ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීමට,

(iv) වෙළඳපොල ගවේෂණය, විශ්ලේෂණය සහ සංඛ්‍යා ලේඛණ ගොඩනැගීම සඳහා,

(c) **නීතිමය බැඳීම් වලට අනුකූල වීම සඳහා,**

(i) දත්ත ආරක්ෂණ නීතිය යටතේ ඔබගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කර අපගෙන් ඉල්ලීම් කරවිට,

(ii) නීතිමය සහ නියාමන අවශ්‍යතා සහ ඊට අදාල සියළු අනුකූලවීම් වලට යටත් වීම සඳහා.

(iii) නීතිමය අයිතිවාසිකම් ස්ථාපිත කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා,

(iv) අපරාධ වැළැක්වීම, හඳුනාගැනීම සහ විමර්ශනය සම්බන්ධ කටයුතු කිරීම සඳහා,

(v) ඔබගේ අනන්‍යතාවයන් තහවුරු කිරීම, ණය වංචා වැළැක්වීම සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ පරීක්ෂා කිරීම,

(vi) ඔබගේ ගිණුමේ මෙහෙයුම් සඳහා අදාළ ඊමේල්, ඇමතුම්, වෙනත් සන්නිවේදන සහ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමට,

(vii) ජාතික ආරක්ෂාව, මූල්‍ය පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීමේ අරමුණ සඳහා,

(d) **ඔබේ කැමැත්ත මත පදනම්ව**

i) ඔබගේ හිමිකමක් වෙනුවෙන් ඔබ වෙනුවෙන් ඉදිරිපත් වන පුද්ගලයින්ට හෝ සංවිධානවලට ඔබගේ පුද්ගලික දත්ත හෙළි කරන ලෙස ඔබ අපෙන් ඉල්ලා සිටින විට,



Classification:Public

ii) අපි ඔබගේ ඉල්ලීම මත ඔබ පිළිබඳ කිසියම් විශේෂ කාණ්ඩ පුද්ගලික දත්ත සකසන විට (උදා. - ඔබේ වාර්ගික හෝ වාර්ගික සම්භවය)
iii) ඔබගේ කැමැත්ත ඇතිව අලෙවිකරණ සම්බන්ධ සන්නිවේදන ඔබ වෙත යැවීමට.

### 3. අප එකතු කරන සහ සකස් කරන පෞද්ගලික තොරතුරු වර්ග

NDB බැංකුව අදාළ රෙගුලාසි සහ නීතිවලට අනුකූලව පමණක් ඔබේ තොරතුරු රැස්කර ක්‍රියාකරයි.

පහත සඳහන් තොරතුරු පුද්ගලික තොරතුරු වලට ඇතුළත් විය හැකි නමුත්, ඒවාට සීමා විය නොහැක.

i) නම සහ ලිපිනය (ස්ථිර සහ තැපැල්), උපන් ස්ථානය සහ දිනය සහ සම්බන්ධතා තොරතුරු (දුරකථන අංකය/ඊ-මේල්), ජාතිකත්වය, ජාතික හැඳුනුම්පත් අංකය, රැකියාව/ව්‍යාපාර තොරතුරු ඇතුළු මූලික පුද්ගලික තොරතුරු
ii) අපගෙන් බැංකු ගිණුම් හෝ වෙනත් සේවාවක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී ඔබ විසින් සපයා ඇති ගිණුම් සහ ගණුදෙනු තොරතුරු සහ ඉතිහාසය ඇතුළු මූල්‍ය තොරතුරු, ප්‍රති පාර්ශවයන්ගේ විස්තර, ගෙවීම්, ගෙවන්නන්ගේ විස්තර, මූල්‍ය වගකීම්, බැංකු ප්‍රකාශනවල පිටපත් සහ වෙනත් මූල්‍ය ආයතනවල ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශන ආදිය.
iii) ඔබේ පවුලේ උදවිය, දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් ලෙස (PEP) තහවුරු කිරීම, ජීවන රටාව සහ සමාජ තත්වයන් සහ මනාපයන් පිළිබඳ තොරතුරු
iv) පුද්ගලික ධනය, වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ සාක්ෂි, ණය සහ ණය ගැනීමේ ඉතිහාසය, වාර්ෂික පිරිවැටුම සහ අපේක්ෂිත පරිමාවන් ඇතුළු ඔබේ මූල්‍ය තත්වයන් පිළිබඳ තොරතුරු
v) අධ්‍යාපනය, රැකියා සහ ව්‍යාපාර පිළිබඳ තොරතුරු
vi) සපයනු ලබන භාණ්ඩ හා සේවා
vii) ඩිජිටල් සේවාවන් වෙත පිවිසීමේදී සිදුකරන ගණුදෙනුකරුවා හඳුනාගැනීම සහ සත්‍යාපනය සිදුකිරීමේදී ලබාගන්නා වීඩියෝ, හඬ පටිගත කිරීම, ඇඟිලි සලකුනු, ඡායා රූප, පුද්ගලික හැඩහුරුකම (හඳුනා ගැනීම සහතික කරනු ලබන ලේඛනවල පිටපත්, ආරක්ෂිත කැමරා දෘශ්‍ය පිටපත්) සහතික කරන තොරතුරු
viii) අපගේ ඩිජිටල් හෝ ඔන්ලයින් සේවාවන් භාවිතා කිරීමේදී ඇති ඩිජිටල් තොරතුරු, ස්ථානය පිළිබඳ විස්තර (ඔබගේ උපාංගයේ සක්‍රීය කර ඇත්නම්), සමාජ මාධ්‍ය තොරතුරු සහ ක්‍රියාකාරකම්, අපගේ වෙබ් අඩවි සහ යෙදවුම් සමඟ ඔබගේ අන්තර් ක්‍රියාකාරීත්වය මත පදනම්ව උදාහරණයක් ලෙස, ඔබගේ බැංකු ගිණුම් සහ පිවිසුම් තොරතුරු, අන්තර්ජාල ප්‍රොටෝකෝලය (IP) ලිපිනය, ස්මාර්ට් උපාංග තොරතුරු ආදිය, ස්ථාන ඛණ්ඩාංක, ඔන්ලයින් සහ ජංගම බැංකු ආරක්ෂණ සත්‍යාපනය, ජංගම දුරකථන ජාල තොරතුරු, සෙවීම්, වෙබ් අඩවිය වෙත පැමිණීම්, වියදම් රටා, කුකීස් භාවිතයෙන් රැස් කරන ලද තොරතුරු
ix) NDB බැංකුවේ ගණුදෙනුකරුවෙකු/කාඩ්පත් හිමියෙකු ලෙස ඔබ විසින් සිදු කරන ලද ගණුදෙනු සම්බන්ධ තොරතුරු



Classification:Public

## 4. අප තොරතුරු රැස් කරන ආකාරය

ඔබ NDB වෙත පැමිණෙන අවස්ථාවේ හෝ අපගේ වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය ජාලා, විද්‍යුත් මාධ්‍යයන් භාවිතයේ දී, පෞද්ගලික සහ පොදු උත්සව වලට සහභාගිවීමේ දී, අපගේ අලෙවිකරණ ප්‍රචාරණ රැළි වලට සහ සමීක්ෂණ වලට සහභාගී වීමේදි, නව ගිණුමක් ආරම්භයේදී වැනි අවස්ථා වලදි NDB බැංකුව ඔබගෙන් සෘජුවම තොරතුරු රැස් කරයි. මීට අමතරව පහත සඳහන් තෙවන පාර්ශව හරහා ද ඔබගේ පෞද්ගලික තොරතුරු රැස් කළ හැක. (සම්පූර්ණ හෝ නිශ්චිත ලැයිස්තුවක් නොවේ)

i ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු

ii. ඔබ විසින් ලබා දුන් විමසීම් මූලාශ්‍ර මාර්ගයෙන්

iii. ණය තොරතුරු කාර්යාංශය මාර්ගයෙන්

iv. වර්ල්ඩ් චෙක් වැනි ආයතනවල / පුද්ගලයන්ගේ තොරතුරු ලබා ගත හැකි පරිශීලන දත්ත ගබඩා මාර්ගයෙන්

කෙසේ වෙතත්, අප රැස් කරන පුද්ගලික තොරතුරු අපගේ නිෂ්පාදනයන් සහ සේවාවන් සැපයීමේ අවශ්‍යතාවන්ට සීමා වේ.

## 5. අප පුද්ගලික තොරතුරු ගබඩා කිරීම සහ සැකසුම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කරන ආකාරය.

NDB බැංකුව ඔබගේ දත්ත ආරක්ෂා කිරීමේ වැදගත්කම මනාව වටහා ගෙන ඇත. එමනිසා, ඔබගේ පුද්ගලික තොරතුරු නිශ්චිත, පැහැදිළි සහ නිත්‍යානුකූල අරමුණු සඳහා භාවිතා කරන බවට අප සහතික වන අතර ඔබගේ තොරතුරු සුරක්ෂිතව තබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුල බලාත්මක නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රමාණවත් පාලනයන් බලාත්මක කරන්නෙමු.

NDB බැංකුව පුද්ගලික තොරතුරු ගබඩාකරණයේදී අවශ්‍ය තොරතුරු තාක්ෂණ පාලන පියවර සහ භෞතික ආරක්ෂණ පාලනයන් භාවිතා කරමින් එම තොරතුරු වල රහස්‍යභාවය, අඛණ්ඩතාවය සහ ලබාගත හැකි බව ආරක්ෂා කරයි.

### ඔබගේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කෙරෙන අවස්ථා

NDB බැංකුව වෙත පාරිභෝගිකයාගෙන් ලැබෙන තොරතුරු ඉතා රහසිගතව තබා ගැනෙන අතර, එම තොරතුරු ශ්‍රී ලංකාවේ අදාළ නීතිවලට අනුකූලව තබා ගැනීම, භාවිත කිරීම හෝ හෙළිදරව් කිරීම බැංකුව විසින් සහතික කරයි. කෙසේ වෙතත්, NDB බැංකුව එවැනි තොරතුරු වෙනත් පාර්ශවයන් සමඟ බෙදා ගැනීමට නීත්‍යානුකූලව බැඳී සිටින අවස්ථා වලදී එම අවශ්‍යතාවයේ ස්වභාවය අනුව අවශ්‍ය තොරතුරු හෙලිදරවු කල හැකිවේ. අප විසින් තෙවන පාර්ශවයන්ට පුද්ගලික තොරතුරු ලබා දෙන අවස්ථා වලදී එම තොරතුරු හසුරුවන ආකාරය නියාමනය කිරීම සඳහා අපි සියලුම තෙවන පාර්ශවයන්ට දැඩි තොරතුරු ආරක්ෂාවක් සහ රහස්‍යභාවය රැකෙන අයුරින් කොන්දේසි පනවා එම පාර්ශව වෙත තොරතුරු ලබා දෙන්නෙමු.



Classification:Public

අපට ඔබගේ පුද්ගලික තොරතුරු හෙළි කළ හැකි අවස්ථාවල උදාහරණ පහත දැක්වේ.

i) අපගේ නීතිමය සහ නියාමන බැඳීම් වලට අනුකූල වීමට. උදා:. ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඉල්ලීම්/විධාන
ii) අවදානම් කළමනාකරණය කිරීමට, ඔබේ අනන්‍යතාවය තහවුරු කිරීමට
iii) NDB බැංකුවට සේවා සැපයීම සඳහා නියැලී සිටින බාහිර ආයතනයකට හෝ තෙවන පාර්ශවයකට. මෙම සේවා සපයන්නන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටිය හැක. උදා:. ණය එකතු කරන්නන්, අයදුම්පත් සැකසීමට නියැලී සිටින පුද්ගලයින්, තාක්ෂණික සේවා සපයන්නන් යනාදිය.
iv) බැංකුවේ ඇතැම් කාර්යයන් ඉටුකිරීම සඳහා බාහිර පාර්ශව වෙත පවරා ඇති අවස්තා වලදී උදා.: මුදල් බෙදාහැරීම් සිදුකරන සේවා නියෝජිතයන්
v) ඔබේ බලයලත් නියෝජිතයන් හෝ ඔබේ පුද්ගලික තොරතුරු හෙළි කිරීමට ඔබ අපට බලය දී ඇති ඕනෑම පුද්ගලයෙකුට
vi) ඔබට ණය මුදලක් ලබා දීම හෝ ඔබෙන් NDB බැංකුව වෙත ගෙවිය යුතු යම් මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් අප සම්බන්ධ ණය වාර්තාකරණ ආයතන
vii) NDB සමූහයේ වෙනත් සමාගමකට අදාළ නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳ තොරතුරු ඔබ ඉල්ලා සිටින අවස්ථාවකදී මෙම නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳව ඔබව දැනුවත් කිරීම සඳහා
viii) යම් යම් ගණුදෙනු සම්බන්ධයෙන් නියෝජිත බැංකු විසින් NDB බැංකුව වෙත යොමු කරන ලද විමසීම්වලට ප්‍රතිචාර දක්වන විට

නීතියෙන් අවසර දී නොමැති අවස්ථාවකදී, එවැනි තොරතුරු හෙලිදරවු කිරීමට පෙර අප ඔබගෙන් පූර්ව අනුමැතියක් ලබා ගන්නෙමු.

## 6. නිර්නාමික දත්ත

ඔබේ තොරතුරු ඔබේ පෞද්ගලිකත්වය නිරාවරණය නොවන ආකාරයට සංඛ්‍යානමය හෝ සැකසූ දත්ත බවට පරිවර්තනය කළ හැකි වේ. NDB සමාගම් සමූහය තුළ සහ ඉන් පිටත, සංඛ්‍යානමය විශ්ලේෂණය, පර්යේෂණ සහ වෙනත් ව්‍යාපාරික අරමුණු සඳහා, අපි එවැනි නිර්නාමික දත්ත සමුච්චිත ආකෘති ආකරයෙන් හුවමාරු කර ගැනීම සිදු කරන්නෙමු.

උදාහරණයක් ලෙස; පර්යේෂණ සඳහා සහාය වීමට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වියදම් ප්‍රවණතා පිළිබඳ තොරතුරු බෙදා ගැනීම.

## 7. මෙරටින් පිටතට තොරතුරු හෙලිදරව් කරන අවස්ථා

NDB බැංකුව නීත්‍යානුකූල බැඳීම්වලට අනුකූල වීම සඳහා සහ මහජන අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා හෝ අපගේ නීත්‍යානුකූල අවශ්‍යතා සඳහා තොරතුරු මෙරටින් පිටට හෙලිදරව් කිරීමට සිදු විය හැකිය. කෙසේ වෙතත්, එම තොරතුරු නීත්‍යානුකූලව හෙලිදරව් කෙරෙන බවටත් සුදුසු මට්ටමේ ආරක්ෂාවක් යටතේ එය සිදුකරන බවටත් අපි සහතික වෙමු.

අපගේ යම් තොරතුරු පද්ධති යටිතල ව්‍යුහයක් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා තිබෙන අවස්ථාවකදී, NDB බැංකුව ඔබේ පුද්ගලික තොරතුරු විදේශයකට මාරු කිරීමට අවශ්‍ය විය හැක. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවෙන් පිටත එවැනි ඔබගේ පුද්ගලික තොරතුරු මාරු කිරීමට පෙර අපි ඔබට කල්තියා දැනුම් දෙන අතර, ඒ සඳහා ඔබේ පෙර අනුමැතිය ලබා ගන්නෙමු.

**8. අපි ඔබේ තොරතුරු කොපමණ කාලයක් තබා ගන්නේද?**

NDB බැංකුව ඔබේ පුද්ගලික තොරතුරු NDB දත්ත රඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව සුරක්ෂිතව තබා ඇති බව සහතික කරන අතර NDB බැංකුව විසින් නීතිමය සහ විධිමත් අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ඔබේ තොරතුරු දිගු කාලයක් රඳවා තබා ගත හැක. කෙසේ වෙතත්, දත්ත තවදුරටත් අවශ්‍ය නොවන විට බැංකුව ඔබේ පුද්ගලික තොරතුරු විනාශ කර දැමීම හෝ පද්ධති වලින් ඉවත් කිරීම් කරනු ඇත..

**9. ඔබේ අයිතිවාසිකම්**

පවතින නීතිමය සහ නියාමන ප්‍රතිපාදන වලට අනුකූලව,

(i) ඔබගේ පෞද්ගලික තොරතුරු NDB බැංකුවෙන් ඉල්ලුම් කිරීමෙන් පසුව එම දත්ත වෙත ප්‍රවේශ වීමට ඔබට අයිතියක් ඇත.

(ii) අපි ඔබෙන් රැස් කරන පුද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීමට, මකා දැමීමට, සැකසීම සීමා කිරීමට ඔබට අයිතියක් ඇත. ඔබට එවැනි ඉල්ලීමක් ලිඛිතව බැංකුව වෙත ඉදිරිපත් කළ හැකි අතර එය පිළිගත හැකි හඳුනාගැනීම් තහවුරු කිරීමකින් සහ/හෝ ඔබෙන් වාචික ප්‍රශ්න කිහිපයක් ඇසීමෙන් ඔබේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසුව සිදුකළ හැක.

(iii) NDB බැංකුව සතුව පවතින ඔබේ තොරතුරු අසම්පූර්ණ, සාවද්‍ය, අදාළ නොවන, යල් පැන ගිය හෝ නොමඟ යවන සුළු යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, අප සතුව ඇති ඔබේ පුද්ගලික තොරතුරු නිවැරදි කරන ලෙස ඔබට අපෙන් ඉල්ලා සිටිය හැක. NDB බැංකුව ඔබේ ඉල්ලීම කඩිනමින් ක්‍රියාත්මක කරනු ඇත. කෙසේ වෙතත්, පැහැදිලිවම පදනම් විරහිත ඉල්ලීමක් මත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය NDB බැංකුව සතුය.

පහත දැක්වෙන අවස්ථා වලදීද ඔබේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය NDB බැංකුව සතුය.

- නීත්‍යානුකූල නොවන අවස්ථාවන්;
- පුද්ගලයෙකුගේ ජීවිතයට, ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට හෝ මහජන සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට බරපතල තර්ජනයක් එල්ල වන අවස්ථා;
- අන් අයගේ පෞද්ගලිකත්වය කෙරෙහි අසාධාරණ බලපෑමක් ඇති කරන අවස්ථා;
- වාණිජමය වශයෙන් සංවේදී තීරණ ගැනීමේ ක්‍රියාවලියක දී
- සාපරාධී ක්‍රියාදාමයන් හෝ එවන් කටයුත්තක් සම්බන්ධයෙන් ඔබ සමඟ සාකච්ඡා කරන අවස්ථාවකදී හෝ



Classification:Public

- නීතිමය ආරවුල් විසඳීමේ ක්‍රියාවලියට අදාළ ඇතැම් තොරතුරු හෙළි වන අවස්ථා

(iv) පැහැදිලිවම අසාධාරණ හෝ පදනම් විරහිත ඉල්ලීමක් මත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීමට සහ/හෝ තොරතුරු සැපයීමට හෝ ඉල්ලා සිටින ක්‍රියාමාර්ග ගැනීමට පරිපාලන ගාස්තුවක් අය කිරීමට අපට අයිතියක් ඇත.

(v) ඔබේ දත්ත සැකසීමට බැංකුවට ලබා දී ඇති ඔබේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට ඔබට අවශ්‍ය නම්, ඔබට ඕනෑම වේලාවක එසේ කළ හැකිය.

(vi) NDB බැංකුව විසින් මෙම රහස්‍යතා නිවේදනය කඩ කර ඇති බවට ඔබ විශ්වාස කරන්නේ නම් සහ එවැනි කඩකිරීමක් NDB බැංකුව වෙත ලිඛිතව දැනුම් දීමෙන් පසු සාධාරණ කාලසීමාවක් තුළ නිවැරදි කිරීමට සුදුසු පියවර ගෙන නොමැති බව ඔබ විශ්වාස කරන්නේ නම්, දත්ත ආරක්ෂණ පනත යටතේ ඔබේ අයිතිවාසිකම් අනුව දත්ත ආරක්ෂණ අධිකාරියට පැමිණිලි කිරීමට ඔබට හැකියාව ඇත.

**10. රහස්‍යතා නිවේදනය සංශෝධනය කිරීම**

මෙම රහස්‍යතා නිවේදනය ඕනෑම වේලාවක සංශෝධනය කිරීමේ අයිතිය අප සතු වන අතර, එවැනි ඕනෑම සංශෝධනයක් NDB බැංකු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

**11. විමසීම් සහ පැමිණිලි**

NDB බැංකුව ඔබේ පුද්ගලික තොරතුරු හසුරුවන ආකාරය සම්බන්ධ ඕනෑම විමසීමක් හෝ පැමිණිල්ලක් සඳහා, https://www.ndbbank.com/contact හි ඇති සම්බන්ධතා තොරතුරු භාවිතා කර අප හා සම්බන්ධ වන්න.

**12. පාලන නීතිය**

NDB බැංකුව සහ ඔබ අතර පවතින සබඳතාවය පිළිබඳව යම් ආරවුලක් ඇති වුවහොත්, NDB බැංකුව සහ ඔබ අන්‍යෝන්‍ය එකඟතාවයකින් සුහදශීලී සාකච්ඡා කිරීම් මඟින් විසඳා ගත යුතුය. එසේ විසඳා ගත නොහැකි අවස්ථාවක, එම ආරවුල ශ්‍රී ලංකාවේ අධිකරණය වෙත යොමු කරනු ඇත.

**NDB බැංකුව**

*****************



Classification:Public